# නිවේදනයයි

<u>**ඩෙංගු රෝගය වැළදී ඇති විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩලය වෙත කෙරෙන දැනුම්දීමයි.**</u>

විශ්වවිද්‍යාලයේ සියලුම ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සහ කාර්ය මණ්ඩලයේ මහත්ම මහත්මීන් වෙත,

වර්තමානයේ රට තුළ පවතින ඩෙංගු වසංගත තත්ත්වය සැලකිල්ලට ගනිමින්, විශ්වවිද්‍යාල ප්‍රජාවේ සෞඛ්‍ය සහ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීම අත්‍යවශ්‍ය වේ.

ඒ අනුව, <u>ඩෙංගු රෝගය</u> වැළදී ඇති බවට වෛද්‍යවරයෙකු විසින් තහවුරු කර ඇති හෝ <u>ඩෙංගු රෝගය</u> හේතුවෙන් ප්‍රතිකාර ලබන සියලුම විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්, ඒ පිළිබඳව පහත තොරතුරු හැකි **ඉක්මනින් විශ්වවිද්‍යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත දැනුම් දීමට කාරුණිකව කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමු.**

1. ශිෂ්‍ය/ශිෂ්‍යාව/කාර්ය මණ්ඩල සාමාජිකයාගේ නම:
2. ශිෂ්‍ය/ශිෂ්‍යාව ගේ ලියාපදිංචි අංකය/ කාර්ය මණ්ඩල සාමාජිකයාගේ සේවා අංකය:
3. පීඨය/ අංශය/දෙපාර්තමේන්තුව:
4. දුරකථන අංකය:
5. දැනට සිටින ස්ථානයේ ලිපිනය:
    - නිවස
    - නේවාසිකාගාරය
    - රෝහල

**විශ්වවිද්‍යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ සම්බන්ධතා තොරතුරු**

නම : එච්. ඩබ්. සී. කේ. සිල්වා මහතා / එච් ආර් එල් සේනාධිර මහතා
දුරකථන අංකය : 071 537 1519 / 0715371510
WhatsApp අංකය: 077 269 2131

තවද, ඩෙංගු රෝගයෙන් සුවය ලබා නැවත අධ්‍යයන කටයුතු හෝ රාජකාරි සඳහා වාර්තා කිරීමේදී, අදාළ වෛද්‍ය වාර්තා සහ රෝගය සම්බන්ධ පරීක්ෂණ වාර්තා විශ්වවිද්‍යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත ඉදිරිපත් කිරීමට ද කාරුණිකව කටයුතු කරන ලෙස දන්වා සිටිමු.

විශ්වවිද්‍යාල ප්‍රජාවේ සෞඛ්‍ය සහ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ඔබගේ පූර්ණ සහයෝගය අපේක්ෂා කරමු.

ස්තුතියි.

**ලේඛකාධිකාරී**
**කොළඹ විශ්වවිද්‍යාලය**